ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2024.12. 27 |

අනුර කුමාර දිසානායක මැතිතුමා,

ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපති,

ජනාධිපති ලේකම් කාර්යාලය,

කොළඹ 01

ගරු ජනාධිපතිතුමනි,

**<u>මියන්මාරයේ සිට පැමිණි රැකවරණ පතන්නන් සම්බන්ධයෙන් හදිසි මැදිහත්වීමක් සඳහා.</u>**

මියන්මාරයේ සිට රැකවරණ පතන්නන් 115 දෙනෙකු මීට දින කිහිපයකට පෙර මුලතිව් වෙරළට ඔබ්බෙන් මුහුදු මාර්ගයෙන් පැමිණීමට අදාළව මෙම ලිපිය ඔබතුමන් වෙත යොමු කරන්නෙමු. එම පිරිසෙන් හතළිහකට වැඩි පිරිසක් කුඩා දරුවන් වන අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ළදරුවන් බවද වාර්තා වේ.

2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතේ දරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව සඳහන් වන 5 වැනි වගන්තිය වෙත ඔබතුමන්ගේ අවධානය යොමු කරනු කැමැත්තෙමු. එකී අයිතිවාසිකම් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පමණක් සීමා වූවක් නොවන අතර ශ්‍රී ලංකාවේ අධිකරණ බල ප්‍රදේශය තුළ සිටින සියලුම පුද්ගලයන්ට එම අයිතිවාසිකම් හිමි බව ඒ මගින් පිළිගෙන ඇත. මෙම සන්දර්භය තුළ, ශ්‍රී ලංකා රජය එකී පනතේ 5(2) වගන්තියට අවනත වීමට බැඳීමක් පවතින අතර, එහි අවධාරණය කර ඇති: **<u>"රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ සමාජ සුබසාධන ආයතන, අධිකරණ පරිපාලන බලධාරීන් හෝ ව්‍යවස්ථාදායක මණ්ඩල යන කවරක් හෝ විසින් ළමයින්ට අදාලවන යම් කාරණයක් බාරගනු ලැබුවේද, ඒ සියලු කාරණයකදීම ළමයාගේ උපරිම සුබ සිද්ධියට ප්‍රමුඛස්ථානය දිය යුතුය."</u>** (ඔබතුමන්ගේ කාරුණික අවධානය පිණිස අවධාරණය කර ඇත)

ඉහත රැකවරණ පතන්නන් පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ යාපනය ප්‍රාදේශීය කාර්යාලය, ත්‍රිකුණාමලය ප්‍රදේශීය කාර්යාලය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පර්යේෂණ සහ අධීක්ෂණ අංශය විසින් සිදු කරන ලද මූලික විමර්ශනවලදී ඉහත සඳහන් රැකවරණ පතන්නන් පිරිසේ සාමාජිකයින් 103 දෙනෙකු මුලතිව් ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර තුළ රඳවා සිටින බව අනාවරණය කරගන්නා



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ලද අතර, මෙම රැකවරණ පතන්නන් සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුව හරහා ආහාර ලබාදීම සිදුකරනු ලබයි. මීට අමතරව එම පිරිස සමඟ සිටි තවත් 12 දෙනෙකු මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කර ඇති අතර, ආගමන විගමනන පනතේ විධි විධාන ප්‍රකාරව එම 12 දෙනා ත්‍රිකුණාමලය රක්ෂිත බන්ධනාගාරයේ රඳවා ඇත.

2024 දෙසැම්බර් 26 වන දින, පර්යේෂණ සහ අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ ඇතුළු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් මුලතිව් හි පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරට ගොස් ඉහත කී රැකවරණ පතන්නන්ගේ රැඳවුම් තත්ත්වය හා සුභසාධනය සොයා බැලීමට උත්සාහ කරන ලදී. කෙසේ වෙතත්, මෙම නිලධාරීන්ට ඉහත කී සරණාගතයින් බැලීම සඳහා ප්‍රවේශය ආගමන විගමන පාලක ජෙනරාල්වරියගේ අවසරයකින් තොරව ලබාදිය නොහැකි බව ප්‍රකාශ කොට ගුවන් නිලධාරීන් විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. එම රැකවරණ පතන්නන් වෙත කිසිදු තැනැත්තෙකුට ප්‍රවේශ වීමට අවසර නොදෙන ලෙස ආගමන විගමනන පාලක ජනරාල්වරිය වෙතින් තමාට නියෝග ලැබී ඇති බව ඉහත කී රැකවරණය පතන්නන් රඳවා තිබූ ගුවන් හමුදා කඳවුර භාර ප්‍රධාන නිලධාරියා මානව හිමිකම් කොමිසම් සභවේ නිලධාරීන්ට දැනුම්දෙන ලදී. ඉන් අනතුරුව මානව හිමිකම් කොමිෂන් සභාව මගින් ලිඛිත ඉල්ලීමක් කරන්නේනම් ප්‍රවේශ පහසුකම් ලබාදිය හැකි බව ආගමන විගමනන දෙපාර්තමේන්තුවේ සහකාර පාලකවරයෙකු විසින් දුරකථනය මගින් දන්වන ලද අතර, ඊට අනුකූලව කොමිෂන් සභවේ ලේකම්වරයා අදාළ ප්‍රවේශය ලබාදෙන ලෙස ඉල්ලා ආගමන විගමනන පාලක ජනරාල්වරිය වෙත වෙත ලිඛිත ඉල්ලීමක් යොමු කරන ලදී. ඉන් අනතුරුව උක්ත ලිපියට ප්‍රතිචාර ලෙස ආගමන විගමනන දෙපාර්තමේන්තුවේ සහකාර පාලකවරයා විසින් වාචිකව දන්වන ලද්දේ මෙම රැකවරණ පතන්නන් වෙත ප්‍රවේශය ලබාගැනීම සිය දෙපාර්තමේන්තුව මගින් නොව මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා වෙතින්ම අවසරය ලබාගන්නා ලෙසය. එහෙත් මෙම කරුණු ආගමන විගමනන පාලක ජනරාල්වරිය විසින් ලිඛිත සන්නිවේදනය නොකරන ලදී.

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් පනතේ 11(ඈ) වගන්තිය ප්‍රකාරව "අධිකරණමය අඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ රඳවාගෙන සිටින තැනැත්තන්ගේ සුභ සිද්ධිය, ඔවුන් රඳවගෙන සිටින ස්ථාන නිරතුරුව පරීක්ෂා කිරීමෙන් සුපරීක්ෂණය කිරීම සහ ඔවුන් රඳවාගෙන සිටීමේ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිර්දේශ ඉදිරිපත් කිරීම" මානව හිමිකම් කොමිෂන් සභාව වෙත බලය පවරා ඇත. එපමණක් නොව, එකී පනතේ 28(2) වගන්තිය මගින් **"කොමිෂන් සභාව විසින් බලය පවරන ලද නිලධාරීන්ට කොමිෂන් සභාව විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් කවර හෝ වේලාවකදී, යම් තැනැත්තකු රඳවා අධිකරණ ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් රඳවාගෙන සිටින යම් රැඳවුම් ස්ථානයකට, පොලිස් ස්ථානයකට, බන්ධනාගාරයකට හෝ වෙනත් යම් ස්ථානයකට ඇතුළු වී, එහි රඳවා සිටින තැනැත්තන්ගේ රඳවා සිටින කොන්දේසි නිසැකව දැනගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ යම් පරීක්ෂා ඒ ස්ථානයේ කළ හැකිය: නැතහොත් එහි සිටින යම් තැනැත්තකුගෙන් යම් විමසීමක් කළ හැකිය."**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි බලතල සහ කාර්යයන් ශ්‍රී ලාංකික පුරවැසියන්ට පමණක් නොව රඳවා සිටින 'ඕනෑම තැනැත්තෙකුට' අදාළ වන බව පැහැදිලිවම පෙනීයයි. **ඒ අනුව, ඉහත සඳහන් කළ මුලතිව් ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරට ඇතුළු වීමට මානව හිමිකම් කොමිසමට ව්‍යවස්ථාපිත බලයක් පවතින අතර, ඔවුන් අතර සිටින ඉහත කී ළමයින් ඇතුළු සියලු රැකවරණ පතන්නන්ගේ රඳවා තබා ගැනීමේ කොන්දේසි පිළිබඳව සොයා බැලිම කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත වගකීමක්ද වේ.**

මේ අනුව මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, ආගමන විගමනන දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාල ආයතනයන් වෙත උක්ත රඳවා ඇති රැකවරණ පතන්නන් වෙත කොමිෂන් සභා නිලධාරීන්ට බාධාවකින් තොරව ප්‍රවේශ වීමටත්, ළමයින් ඇතුලු සියලු රැකවරණ පතන්නන් වෙතින් තොරතුරු ලබාගැනීමට

අවශ්‍ය ප්‍රවේශ පහසුව ලබා ගැනීමට එකී ආයතන වෙත සුදුසු නියෝග නිකුත් කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ත්‍රිවිධ හමුදා සේනාධි නායකයා සහ ආරක්ෂන අමාත්‍යවරයා ලෙස ඔබතුමන්ගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

අදාළ රැකවරණ පතන්නන්ගේ සුභසාධනය ස්වාධීනව සොයා බැලීමට සහ ඔවුන් සම්බන්ධ සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 1996 අංක 21 දරණ පනතින් පැවරී ඇති ව්‍යවස්ථාපිත කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා එකී ප්‍රවේශය අත්‍යාවශ්‍ය වේ.

මේ සම්බන්ධයෙන් ඔබතුමන්ගේ කඩිනම් මැදිහත්වීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

විනිසුරු. එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු, එල්. ටී. බී. දෙහිදෙණිය

සභාපති

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :

01. ආනන්ද විජේපාල මැතිතුමා
    මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු ගරු ඇමතිතුමා
    මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
    18 වන මහළ, සුහුරුපාය, බත්තරමුල්ල

02. බී.එම්.ඩී. නිලූෂා බාලසූරිය මහත්මිය
    ආගමන විගමනන පාලක ජනරාල් (වැඩ බලන)
    ආගමන විගමනන දෙපාර්තමේන්තුව
    සුහුරුපාය, බත්තරමුල්ල

03. එයාර්මාර්ෂල්, ආර්.ඒ.යූ.පී රාජපක්ෂ
    ගුවන් හමුදාපති
    ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය
    ආරක්ෂ මූලස්ථාන සංකීර්ණය
    ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ